

වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

Annual Report

2015

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

மக்கள் தோட்ட அபிவிருத்திச் சபை

JANATHA ESTATES DEVELOPMENT BOARD

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

වාර්ෂික වාර්තාව 2015

දැක්ම

ලාභදායී හා ආර්ථික වශයෙන් ශක්තිමත් රාජ්‍ය සංවිධානයක් බවට පත් කරමින් ඉහළම ශුද්ධ විකුණුම් සාමාන්‍ය අගයක් ලභාකර ගනිමින් ,කලාපයේ හොඳම මැද රට සාම්ප්‍රදායික තේ නිශ්පාදකයා බවට පත්වීම.

මෙහෙවර

ආයතනය සතු සම්පත් උපරිම සකසුරුවමින් යුතුව යොදවා ගනිමින්, කණ්ඩායම් හැඟීමෙන් යුතුව ක්‍රියාකරමින් ,අපේක්ෂිත ඉලක්ක සපුරාගනුවස් කාර්මණ්ඩල කුසලතා සංවර්ධනය තුළින් කර්මාන්තයේ තිරසාර ප්‍රගතියක් ලබාගනින්

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

වාර්ෂික වාර්තාව -2015

පටුන

		පිටු අංක
01	ආයතනික තොරතුරු	01-04
02	සභාපති තුමාගේ පණිවිඩය	05
03	විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්	06-07
04	විගණකාධිපති වාර්තාව	08-22
05	ගිණුම් සටහන්	
	• ගිණුම් කරන ප්‍රතිපත්ති	23-29
	• මූල්‍ය තත්ව ප්‍රකාශය	30
	• ආදායම් ප්‍රකාශය	31
	• මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය	32
	• ගිණුම් සටහන්	33-64
06	2015 වර්ෂයේ විගණන ගිණුම් හා විගණන වාර්තාවල සඳහන් අඩුපාඩු නිවැරදි කිරීමට ගත් ක්‍රියාමාර්ග	65-66
07	2015 වර්ෂය සඳහා ආයතනයේ කාර්ය සාධනය පිළිබඳ සාරාංශය	67-68
08	ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත මධ්‍ය කාලීන ක්‍රියාමාර්ග පිළිබඳ සාරාංශය	69
09	පසුගිය වසර 05 සඳහා සංසන්දනාත්මක තොරතුරු	70
10	ආයතනයේ කාර්යභාරය	71
11	ජනවසම සතු දේපළ ඉඩකඩම් හා ඒවායේ උපයෝජන ස්වභාවය	72-80
12	ආයතන ව්‍යුහය	81
13	මානව සම්පත් පැතිකඩ	82-83
14	වාර්ෂික ආයෝජන සැලැස්ම හා ඊට අනුරූප භෞතික හා මූල්‍ය ප්‍රගතිය	84-85
15	මානව සම්පත් සංවර්ධන සැලැස්ම	86-89

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

වාර්ෂික වාර්තාව -2015

ආයතනික තොරතුරු සැපයීම

නම	-	ජනතා වතු සංවර්ධන මණ්ඩලය.
නෛතික ස්වභාවය	-	1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ සඳහන් කාර්යය සඳහා ,අංක 199/එම හා 1976 පෙබරවාරි 06 දින දරන ගැසට් නිවේදනය ප්‍රකාරව ජනතා වතු සංවර්ධන මණ්ඩලය පිහිටුවන ලදී.
ලියාපදිංචි කාර්යාලය	-	55/ 75 වොක්ෂෝල් පටුමග,කොළඹ 02 .
විගණකවරු	-	විගණකාධිපති
බැංකුකරුවෝ	-	ලංකා බැංකුව මහජන බැංකුව පෑන් ඒෂියා බැංකුව නේෂන් ට්‍රස්ට් බැංකුව

අධ්‍යක්ෂකවරු - 2015 ජනවාරි සිට 2015 නොවැම්බර් දක්වා

1.	ඉංජිනේරු කේ.එම්.එස් .බී .රණකෝගම මහතා	සභාපති
2.	සිවයාමී රාජරත්නම් මහතා	විධායක අධ්‍යක්ෂක
3.	නිරූපමා කරුණාරත්න මහත්මිය	ක්‍රියාකාරී අධ්‍යක්ෂක
4.	ඩී.ජී.එම්.වී.හපුආරච්චි මහතා	අධ්‍යක්ෂක
5.	ඒ.එච්.එම්.රියාස් මහතා	අධ්‍යක්ෂක
6.	ඒ.කතිරේෂන් මහතා	අධ්‍යක්ෂක
7.	දර්ශනා සේනානායක මහත්මිය	භාණ්ඩාගාර නියෝජිත

අධ්‍යක්ෂකවරු - 2015 නොවැම්බර් සිට 2015 දෙසැම්බර් දක්වා

1.	මහාචාර්ය කෙනඩි ගුණවර්ධන මහතා	සභාපති
2.	තරීක් ඕමාර් මහතා	විධායක අධ්‍යක්ෂක
3.	නිරූපමා කරුණාරත්න මහත්මිය	ක්‍රියාකාරී අධ්‍යක්ෂක
4.	නිලූ දිල්හාර විජේදාස මහතා	අධ්‍යක්ෂක
5.	ඒ.එච්.එම්.රියාස් මහතා	අධ්‍යක්ෂක
6.	එස්.එම්.දයාරත්න මහතා	භාණ්ඩාගාර නියෝජිත

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

වාර්ෂික වාර්තාව -2015

ජනවසම ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ කණ්ඩායම

1. හිරාන් දුනුවිල මහතා	සාමාන්‍යාධිකාරී (වැ:බ)
2. නෙවිල් අබේරත්න මහතා	කළමනාකරු (පරිපාලන)
3. එම්.සී ප්‍රේමතිලක මහතා	කළමනාකරු (ප්‍රවාහන/නඩත්තු)
4. කේ.ජේ.ටී.බී.රාජසූරිය මහතා	ගණකාධිකාරී
5. එස්.ඩී.ඩබ්ලිව්.අලෙන්සු මෙනවිය	කළමනාකරු (නීති)
6. රොහාන් බඹරදෙනිය මහතා	කළමනාකරු (ප්‍රාදේශීය කාර්යාලය)
7. නාමල් විජේතුංග මහතා	කළනාකරු (වනසම්පත්) (වැ:බ)
8. සුනිල් රාජපක්ෂ මහතා	සහකාර අභ්‍යන්තර විගණක
9. එස්.ඒ.එල්.පෙරේරා පෙරේරා මහතා	සහකාර ගණකාධිකාරී
10. එච්.ජී අනුර මහතා	සහකාර කළමනාකරු (වෙළඳ)
11. ඩබ්ලිව්.ජී.සී.වාද්දුවගේ මහතා	සහකාර කළමනාකරු (වෙළඳ)
12. කේ.එන්.එස් පෙරේරා මහතා	සහකාර කළමනාකරු (ප්‍රවාහන)
13. සී.එච්.රැටියල මහත්මිය	සහකාර කළමනාකාරිණී (නඩත්තු)
14. ආර්.ඩබ්ලිව්.එම්.එම්.හලංගොඩ මහතා	සහකාර කළමනාකරු (ප්‍රාදේශීය කාර්යාලය)

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

වාර්ෂික වාර්තාව -2015

වතු කළමනාකරණ කණ්ඩායම

වත්ත	කළමනාකරු	වගාව	ප්‍රමාණය (හෙක්ටයාර්)	ලිපිනය
බෝපිටිය	කේ.ජී.එච්.කොස්සින්න මහතා	තේ	321.00	දෙල්තොට
බෝගිල්	එම්.ඩී.අයි.රාජකරුණා මහතා	තේ	490.01	කැටබුලා
දෙල්තොට	පුබුදු රාජපක්ෂ මහතා	තේ	410.10	ගලහා
හන්තාන	නිශාන්ත රාජ් මහතා	තේ	1405.63	නුවර
ගලබොඩ	ඒ.බී.ඩී.ආර්.කුමාර මහතා	තේ	752.75	ගලබොඩ
ග්‍රේට්වැලි	එස්.එම්.සී.බී.එගොඩවෙල මහතා	තේ	465.21	දෙල්තොට
හෝප්	එන්.එස්.අතුකෝරල මහතා	තේ	654.06	හේවාහැට
කන්දල් ඔය	ඩී.බී.එස්.එල්.පෙරේරා මහතා	තේ	930.79	නාවලපිටිය
කොළපතන	ඩබලිව්.සී.එස්.බණ්ඩාර මහතා	තේ	361.00	නාවලපිටිය
ලෙවලන්	සී.ඩී.අලුවිහාරේ මහතා	තේ	1255.92	පුපුරුස්ස
ලූල්කඳුර	එල්.බී.අබේකෝන් මහතා	තේ	1048.03	දෙල්තොට
මහවිල	හර්ෂ කුමාර මහතා	තේ	293.64	උලපනේ
නාගස්තැන්න	ඒ.එස්.දයාරත්න මහතා	තේ	506.82	නාවලපිටිය
රහතුන්ගොඩ	ජී.පුලසිංහ මහතා	තේ	480.14	හේවාහැට
රොක්වුඩ්	අයි.එම්.ඒ.ඩී.බී.ඉලංගකෝන් මහතා	තේ	426.67	හේවාහැට
කුමාරවත්ත	ඩී.සී.කොඩිතුවක්කු මහතා	රබර්	1822.46	මොණරාගල
මවුන්ටජීන්	එන්.හෙට්ටිආරච්චි මහතා	තේ	301.67	වටවල
පලෙයි	වී.එස්.පී.ද මෙල් මහතා	පොල්	682.19	පලෙයි
දියළුම	ඩබලිව්.වී.ඩී හරිස්චන්ද්‍ර මහතා	රබර්	204.09	කොස්ලන්ද
තෙලිපතැන්න	එස්.එම්.එස් .ඩී හුණුගල මහතා	රබර්	85.51	නිකපොත

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

වාර්ෂික වාර්තාව -2015

සභාපතිතුමාගේ පණිවිඩය

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් මෙම ආයතනයේ 2015 වාර්ෂික වාර්තාව සතුටින් ඉදිරිපත්කරමි

2015 වර්ෂයේදී සිදුවූ දේශපාලන වෙනස්කම් මත කළමනාකරණ මණ්ඩල තුනක් යටතේ වරින්වර ජනවසම පාලනය විය. එවැනි කාලවකවානුවක, සිදුවූ විවිධාකාර වෙනස්කම් වලට මුහුණ දෙමින් ආයතනය පවත්වාගෙන යාමට තම කැපවීම ලබා දුන් සියළු සභාපතිවරුන්ට සහ කාර්ය මණ්ඩලවලටද මාගේ හෘදයාංගම ස්තුතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

ජනතා වතු සංවර්ධන මණ්ඩලය වසර 15 ක පමණ දීර්ඝ කාලයක සිට පාඩු පෙන්නුම් කරන අතර, මෙයට බලපාන ප්‍රධාන හේතුව වූයේ ආයතනය සතු හෙක්ටයාර් 12,000ක් වූ ඉඩම් ප්‍රමාණයක් තිබුනද, එම ප්‍රමාණයෙන් ඉඩම් හෙක්ටයාර් 1232ක නැවත තේ රෝපණය කලද හෙක්ටයාර් 2,510ක පරණ තේ පැවතීම සහ ඉතිරිය වගා නොකරන මුඩු ඉඩම් ලෙස පැවතීම දැක්විය හැක. පවතින තේ කර්මාන්තශාලා 4 හි ධාරිතාවයට වඩා අඩුවෙන් භාවිතයට ගැනීමද අලාභ වැඩි වීමට හේතු වී ඇත. ආයතනයේ සිදුවූ සමහර සමුචිත අලාභයන් නිසා කාල පරිච්ඡේද 10ක් තිස්සේ සාමාන්‍ය කෘෂිකාර්මික කටයුතු කර ගෙන යාමට නොහැකි වී ඇත.

පෙර වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ සමස්ථයක් ලෙස තේ නිෂ්පාදනය කි.ග්‍රෑම් 81,731 ක අඩු වීමක් පෙන්නුම් කරන අතර සාමාන්‍ය විකුණුම් අගය රුපියල් 37.57 කින් අඩුවීමක් දක්නට ලැබේ . තවද, රු 467.43 ක්ව තිබූ ඒකක නිෂ්පාදන පිරිවැය රුපියල් 497.80 දක්වා වැඩි වී ඇත.

රබර් සම්බන්ධයෙන් සලකා බලන විට 2014 සහ 2015 වර්ෂයේ නව වගාවන්ගේ ඵලදාව වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස කි.ග්‍රෑම්. 27,337 කින් නිෂ්පාදනය වැඩි වීමක් ඇත. නමුත් 2015 වර්ෂයේ නිෂ්පාදන පිරිවැය රුපියල් 3.01කින් ඉහළ යාම සහ සාමාන්‍ය විකුණුම් අගය රුපියල් 12.01කින් පහළ යාම මගින් නිෂ්පාදනය වැඩි වීමේ ප්‍රතිලාභය අහිමි වී ඇත.

ආයතනය දැනට මුහුණ දෙන දැවැන්තම අභියෝගය වනුයේ ,සේවකයන්ට හා කාර්ය මණ්ඩලයට ගෙවිය යුතු සේවක අර්ථ සාධක, සේවක භාරකාර අරමුදල් හා පාරිතෝෂික මුදල් වල අධික හිඟ මුදලක් පැවතීමයි. 2015 වර්ෂයේ මේ සඳහා රුපියල් මිලියන 350ක මුදලක් ගෙවීම සඳහා භාන්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලැබුනි.

මෙම අභියෝගයන්ට මුහුණ දෙමින් ජනවසම ලාභ ලබන සාර්ථක ආයතනයක් ලෙස පවත්වාගෙන යාම උදෙසා අධ්‍යක්ෂ මණ්ඩලය නිරතුරුව කැපවීමෙන් කටයුතු කරන්නෙමු.

සභාපති
කීර්ති සී කොටගම
ජනතා වතු සංවර්ධන මණ්ඩලය

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

වාර්ෂික වාර්තාව -2015

විගණක හා කළමනාකරණ කමිටු රැස්වීම්

කමිටු සාමාජිකයින්

1. දර්ශනා සේනානායක මහත්මිය - සභාපති විගණන කමිටුව
2. ඩී.ජී.එම්.එච්.හපුආරච්චි මහතා - කමිටු සාමාජික
3. ඒ.එච්.එම්.රියාස් මහතා - කමිටු සාමාජික

ඉහත කමිටු සාමාජිකයින් 2015 මැයි මස 15 වන දින පත්කර ගන්නා ලදී.

නිරීක්ෂක:

විගණන අධිකාරී - රජයේ විගණන අංශය

කැඳවුම්කරු හා ලේකම්

ආර්.එම්.ඩී.එස්.එස්.රාජපක්ෂ මහතා (සහකාර අභ්‍යන්තර විගණක - ජනවසම)

2015 වර්ෂය සඳහා විගණන කමිටුව රැස්වීම් 2 ක් පැවැත්වූ අතර පළමු රැස්වීම 2015.08.20 දින හා දෙවන රැස්වීම 2015.10.09 දින ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලදී. එහිදී පහත සඳහන් කරුණු සාකච්ඡා කරන ලදී.

1. විගණකාධිපති දෙපාර්තමේන්තුව මඟින් ඉදිරිපත් කරන විගණන ගැටළුවලට අදාළ කාලයේම පිළිතුරු සැපයීම
2. 2015 වාර්ෂික අය වැය ලේඛනය පිළියෙල කිරීම
3. වාර්ෂික වාර්තාව පිළියෙල කිරීම
4. ජනවසමට අයත් වාහන පිළිබඳව
5. තේ දළු විකිණීම සම්බන්ධව
6. විගණන කමිටු රැස්වීම් ක්‍රමානුකූලව පවත්වාගෙන යාමට අපොහොසත් වීම
7. ජනවසම වතුවල වන වගාව
8. ජනවසම සාංගමික සැලසුම් පිළියෙල කිරීම
9. ඉඩම්වල විස්තර හා කුලියට දී ඇති ඉඩම්වල ගිවිසුම් පිළියෙල කිරීම
10. සේවක අර්ථ සාධක අරමුදල්,සේවක භාරකාර අරමුදල්, වතු සේවක අරමුදල් සහ ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක අරමුදල සම්බන්ධ තොරතුරු
11. කෝප් රැස්වීමට අදාළ ලියකියවිලි සැකසීම
12. වාර්ෂික තොග ගණනය කිරීම පරීක්ෂාව
13. ආයතනයේ සියලුම අංශ ලේඛනගත කිරීම
14. පරිනත වගාව සම්බන්ධයෙන් විගණන කමිටුවේ තීරණ අනුව ගිණුම් කටයුතු සිදු කිරීම

15. රාජකාරී පැවරුම් ලැයිස්තු පිළියෙල කිරීම
16. දැව වගාවේ ආදායම් සම්බන්ධයෙන් වාර්තා කිරීම
17. ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කිරීම
18. ආයතනයේ සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීම
19. ඉඩම්වල බදු ආදායම් සාකච්ඡා කිරීම
20. සාමාන්‍යාධිකාරී වරයාගේ ඉන්ධන සලාකය වෙන් කිරීම පිළිබඳව සාකච්ඡා කිරීම

සභාපති

විගණන හා කළමනාකරණ කමිටුව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } පිඑල්ජ්/ජ්/ජේඉඩීබී/01/15 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2017 නොවැම්බර්/12 දින.

සභාපති,

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්තව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත්කිරීමේ ප්‍රමාදය හේතුවෙන් මණ්ඩලයේ ගණුදෙනු පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 පෙබරවාරි 15 දින මණ්ඩලයේ සභාපතිවරයා වෙත නිකුත්කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

උත්තරිතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශනය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

1.4 මතය ව්‍යාවනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, ආදායම් ප්‍රකාශනයේ හා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් නිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය ව්‍යාවනය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ආයතනයේ අබණ්ඩ පැවැත්ම

මණ්ඩලයට අයත් වතු 23 ක් අබණ්ඩව ලාභ ලැබීම මත හා ගෙවිය යුතු ව්‍යවස්ථාපිත වගකීම් ප්‍රමාණය අධික වීම හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ ශුද්ධ වත්කම් රු.247,533,243 ක සෘණ අගයක් වී තිබුණි. මෙම ශුද්ධ වත්කම් පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 45 කින් වර්ධනය වී තිබුණද, තව දුරටත් භාණ්ඩාගාරයේ හෝ රජයේ වෙනත් මූල්‍ය සහායක් නොමැතිව මණ්ඩලය පවත්වාගෙන යෑම අවිනිශ්චිත තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය.

2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

ප්‍රමිතයේ 27 වගන්තිය පරිදි මණ්ඩලය විසින් කල්බදු ආදායම, උපචිත පදනම මත ගිණුම් නොතැබීම හේතුවෙන්, 2014 හා ඊට පෙර වර්ෂ වලට අදාල කල්බදු ආදායම රු.57,562,636 ක් හා 2016 වර්ෂයට අදාල කල්බදු ආදායම රු.10,791,154 ක් සමාලෝචිත වර්ෂයේ කල්බදු ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණ තවද 2013 වර්ෂයට අදාල රු.3,082,581 ක තේ ආදායමක් සමාලෝචිත වර්ෂයේ තේ ආදායමට ඇතුළත් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07

(i) ප්‍රමිතයේ 20(ආ) වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන කාර්යාලයට අදාල එහෙත් මුදලින් නොගෙවූ රු.436,819 ක් වූ පාරිතෝෂික අධිභාර වියදම් මූල්‍ය නොවන අයිතමයක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ බදු පෙර ලාභයට ගැලපීම් කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය වියදම් තුල ඇතුලත් රු.10,342,876 ක් වූ බැංකු ණය පොළී මෙහෙයුම් ලාභයට ගලපා, මුදලින් ගෙවූ රු. 4,016,637 ක ණය පොළිය මෙහෙයුම් කටයුතු වල මුදල් ගලායෑමක් ලෙස සටහන් කළ යුතු වුවත් එම ගැලපීම් සිදුකර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේදී මුදලින් ගෙවන ලද දිගුකාලීන බැංකු ණය රු.31,547,120 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාමක් ලෙස හා බැංකුව විසින් කපා හරින ලද පොලි වියදම් රු.41,367,908 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ලාභයට ගැලපීමට කටයුතු කර නොතිබුණු අතර රු.70,218,840 ක් කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08

හන්තාන හා ගලහා වතුයායන් වල ස්ථාවර වත්කම් හා පරිනත තේ වගාවන් සඳහා 2014 වර්ෂයට අදාල ක්‍රමක්ෂය හා ක්ෂය රු.1,609,658 ක් හා 2014 වර්ෂයට අදාල රු.3,338,556 ක රබර් කිරි ආදායමක් ප්‍රමිතයේ 42 හා 49 වගන්ති වලට පටහැනි ලෙස සමාලෝචිත වර්ෂයේ අලාභයට ගළපා තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

2009 වර්ෂයේ සිට 2014 වර්ෂය තෙක් මිලදී ගත් වටිනාකම රු.21,453,236 ක් වූ ස්ථාවර වත්කම් සඳහා ක්ෂය ගැලපීම් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල ක්ෂය වියදම රු.2,421,468 කින් අඩුවී තිබුණි.

2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ ගිණුම් ප්‍රතිපත්තිය අනුව තේ වගාවක් ආරම්භ කර වසර හතරක් අවසානයේදී අදාල වගාව සඳහා දරා ඇති පිරිවැය පරිණත නොවූ වගාවේ සිට පරිණත වූ වගාව වෙත මාරු කළ යුතු වුවත්, හෝප් වතුයායේ 2009 හා 2010 වර්ෂ වලදී ආරම්භ කළ තේ වගාවන් වෙනුවෙන් දරා ඇති රු.14,906,126 ක පිරිවැය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විටත් පරිණත වගාව වෙත මාරු කර නොතිබුණි.

(ආ) මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව උපකරණ, ගෘහ භාණ්ඩ හා සවිකිරීම් සියයට 12.5 බැගින් වාර්ෂිකව ක්ෂය කළ යුතු වුවත් ආයතනය විසින් දීර්ඝ කාලයක සිට මෙම වත්කම් සියයට 5 ක අනුපාතයකට ක්ෂය කිරීම හේතුවෙන් ආයතනය ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට පටහැනිව කටයුතු කර තිබුණි.

2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේ වැඩියෙන් සටහන් වූ රු.2,151,516 ක තේ ආදායම නිවැරදි කිරීමේදී පෙර වර්ෂයේ ලාභයට ගැලපීම් කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ තේ ආදායම්

ගිණුම්වල හර කිරීම් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ පෙන් ආදායම් එම ප්‍රභවයෙන් අඩුවෙන් සටහන් වී තිබුණි.

(ආ) වතු වෙනුගුවන් ප්‍රධාන කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන පාලන ගිණුමේ සටහන් කර තිබුණු රු.2,057,585 ක විවිධ ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස හඳුනාගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අනුව වර්ෂය ආරම්භයේදී පැවති රු.29,862,260 ක කෙරිගෙන යන වැඩ වටිනාකම් ප්‍රවර්තන වර්ෂයේ ඉවත්කිරීම් ලෙස සටහන් කර, වර්ෂය අවසානයේදී පැවති රු.28,504,681 ක වටිනාකම් වර්ෂයේ එකතු කිරීම් ලෙස සටහන්කර තිබුණද, ප්‍රධාන කාර්යාලයේ සහ වතු ගිණුම් අනුව, කෙරිගෙන යන වැඩ වටිනාකම් සඳහා සමාලෝචිත වර්ෂයේදී ඉවත්කල හා එකතුකල වටිනාකම් පිළිවෙලින් රු.8,996,734 ක් හා රු.7,740,582 ක් වූයෙන් මූල්‍ය ප්‍රකාශන මගින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු නිවැරදි නොවන බව විගණනයේදී තහවුරු විය. එසේම කෙරිගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර ඇති වටිනාකම් තුල 2009 හා ඊට පසුව දරන ලද වියදම් ඇතුලත් වී ඇති අතර, 2009 වර්ෂයේදී ආරම්භ කල ව්‍යාපෘති අතරින් බහුතර සංඛ්‍යාවක් වර්තමානය වනවිට අසාර්ථක වී තිබුණි. එම ශේෂ ගිණුම්වලින් කපාහැරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2014 හා 2015 වර්ෂයන්හිදී මඩුන්ජීන් වතුයායේ පිහිටි මණ්ඩලයේ සභාපතිවරයාගේ නිල නිවාසය වෙනුවෙන් දරන ලද රු.1,488,438 ක වියදම් අදාල වර්ෂයන්හි වියදම් ලෙස හඳුනා නොගෙන විවිධ ණයගැතියන් ලෙස ගිණුම් තබා තිබුණි.

(ඉ) උපකරණ, ගෘහ භාණ්ඩ හා සවිකිරීම්වලට අදාල සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම් රු.417,484 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඊ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී පහත සඳහන් අඩුපාඩු සිදු වී තිබීම හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ තුලිතතාවය පිළිබඳ විගණනයේදී ප්‍රශ්නකාරී විය.

(i) ලෙජර් ගිණුම් අනුව සමාලෝචිත වර්ෂයේ රු.39,149,946 ක් වූ පාරිතෝෂික ප්‍රතිපාදනය රු.38,901,897 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබීම හේතුවෙන් රු.248,049 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ii) සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික ගෙවීම් රු.111,486,915 ක් වුවත් එය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු.104,254,000 ක් ලෙස සටහන් කිරීම

හේතුවෙන් මෙහෙයුම් කටයුතුවල මුදල් ගලා යෑම් රු. 7,232,915 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(iii) වටිනාකම රු.1,089,340 ක් වූ හෝප් වතුයායට අදාල උපකරණ ගිණුමේ සිදුකළ ගැලපීම් හා රු.779,485 ක බහාලුම් උපකරණ වතු අතර හුවමාරු කිරීම් ස්ථාවර වත්කම් මිලදී ගැනීම් ලෙස සලකා ආයෝජන ක්‍රියාකාරකම්වල මුදල් ගලා යෑම් ලෙස දක්වා තිබුණි.

(iv) ආයෝජන ක්‍රියාකාරකම තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහය තුල දක්වා ඇති රු.37,038,000 ක් වූ ක්ෂේත්‍ර සංවර්ධන වියදම, ලෙජර් ගිණුම් ප්‍රකාරව රු.34,419,774 ක් වීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු. 2,618,226 ක අගයකින් අඩු වී තිබුණි.

(v) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වර්ෂ අවසාන, මුදල් හා මුදල් සමාන දෑ ලෙස රු.82,220,000 ක් දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂයේ බැංකු සැසඳුම් ප්‍රකාශ හා වතු ගිණුම් අනුව එය රු 82,183,009 ක් විය. එම හේතුවෙන් වර්ෂ අවසාන මුදල් හා මුදල් සමාන දෑ ශේෂයෙහි රු. 36,901 ක වෙනසක් නිරීක්ෂණය විය.

(උ) වගාවන් පරිණත වීමේදී, පරිණත නොවූ වගාවන් යටතේ ප්‍රාග්ධනිත කළ වටිනාකම පරිනත වගාවට එකතු කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව රු.761,070 ක පිරිවැයක් පරිණත නොවූ වෙනත් වගාවෙන් ඉවත් කර තිබුණද, එම අගයෙන් රු.5,146 ක් පමණක් පරිණත වූ වෙනත් වගාවට එකතු කර තිබුණි.

(ඌ) ජාතික කඩදාසි සංස්ථාවේ ඇඹිලිපිටිය කඩදාසි කම්හල වෙත ආරක්ෂක සේවාව සැපයීමට අදාළව ප්‍රවර්ථන වර්ෂයේ මාස 9 ක් වෙනුවෙන් ලැබිය යුතු රු.910,188 ක මුදලක් ගිණුම්ගත කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේදී, වතු 04 ක් විසින් මිල දී ගනු ලැබූ ස්ථාවර වත්කම් හා පරිණත නොවූ වගාවේ සිට පරිනත වූ වගාවන් ලෙස හඳුනා ගනු ලැබූ තේ වගාවන්ට අදාලව ක්ෂය ගැලපීම් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය රු.665,959 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) වතු ගිණුම් අනුව සමාලෝචිත වර්ෂයේදී පරිනත නොවූ වෙනත් වගාවන් සඳහා දරා තිබූ පිරිවැය රු.114,708 ක් වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනැති ශේෂපත්‍රය අනුව පරිනත නොවූ වෙනත් වත්කම් යටතේ රු.1,502,872 ක වටිනාකමක් එකතු කිරීම නිසා රු.1,388,164 ක වටිනාකමකින් අදාල වත්කම් අධිගණනය වී තිබුණි.

2.2.5 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වතුයායන් අතර භාණ්ඩ හා මුදල් හුවමාරු කර ගැනීම වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම් ශේෂයන් (Inter Estate Transaction) එකිනෙකට හිලව් විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසානයේදී වතු ගිණුම් අතර හිලව් නොවූ රු. 8,421,948 ක හර ශේෂයක් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ලුල්කදුර හා නාගස්තැන්න කර්මාන්තශාලා දෙකෙහි වාර්ෂික මූල්‍ය ප්‍රකාශන අනුව තේ ආදායම හා එම වතුවල අස්වනු ලෙජරයන්හි (Crop Ledger) සඳහන් තේ අදායම අතර රු. 495,200 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) වතු 06 කට අදාලව ශේෂ පත්‍රයේ දක්වා තිබූ පාරිතෝෂික වෙන්කිරීම, ගෙවියයුතු පාරිතෝෂික ගිණුම හා පාරිතෝෂික අධිභාර වෙන්කිරීම් ගිණුම යන ගිණුම් තුනෙහි ශේෂ ඊට අදාල උපලේඛන සමඟ සැසඳීමේදී පිළිවෙලින් රු. 1,096,616 ක රු.2,739,733 ක හා රු.158,272 ක වෙනස්කම් පැවතුණි.

(ඈ) විකුණුම ඉන්වොයිසි අනුව, නිමි තේ ආදායමින් අඩුකර ඇති රු.8,252,037 ක් වූ විකුණුම් වියදම් රු.6,965,307 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් එම වියදම් රු.1,286,731 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ වතු ගිණුම් අනුව පරිණත නොවූ තේ වගාව (Immature Plantation – Tea) වෙනුවෙන් වියදමක් දරා නොතිබුණද, අවසන් ගිණුම් තුල රු.3,542,254 ක වියදම පරිනත තේ වගාව යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ වතු ගිණුම් අනුව පරිණත වූ තේ වගාව යටතේ කිසිදු ඉවත් කිරීමක් නිරීක්ෂණය නොවූ නමුත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී රු. 5,040,303 ක වටිනාකමක් පරිණත තේ වගාවෙන් ඉවත් කර තිබුණි.

2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් විෂයයන් ඉදිරියේ දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම නිසා එම ශේෂයන් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට හෝ නොහැකි විය.

විෂයය	වටිනාකම	ඉදිරිපත් නොකළ සාක්ෂි
	රු.	
(අ) ගොඩනැගිලි	1,539,765,345	(i). උපලේඛන (ii). ස්ථාවර වත්කම් ලේඛනය
(ආ) වතු 03 කට අදාලව පාරිතෝෂික වෙන්කිරීම, ගෙවියයුතු පාරිතෝෂික හා පාරිතෝෂික අධිභාර වෙන්කිරීම.	209,061,775	පාරිතෝෂික ගෙවීම් උපලේඛන
(ඇ) වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ගිණුම්	550,234,588	(i). උපලේඛන (ii). ණයගැති ශේෂ වයස් විශ්ලේෂණය (iii). ශේෂ සනාථන ලේඛන
(ඈ) ගෙවිය යුතු වෙළඳ ගිණුම්	549,734,176	(i). උපලේඛන (ii). ණයහිමි ශේෂ වයස් විශ්ලේෂණය

2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල රු.39,606,458 ක බදු කුලී ආදායමක් සහ බදු දී ඇති ආයතන වෙත ආරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ රු.6,701,445 ක ආදායමක් අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(ආ) වසර 05ක් ඉක්මවූ රු.7,083,975 වතු ණයහිමි ශේෂයන් පියවීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ඇ) මණ්ඩලයේ නිමි තේ අලෙවිකිරීමට අදාලව, රජයේ වෙළඳ ආයතනයකින් ලැබිය යුතු රු.3,717,404 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

සහත සඳහන් නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම නිරීක්ෂණය විය.

නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම
(අ) 1980 අංක 46 දරන සේවා නියුක්තිකයිනගේ භාර අරමුදල් පනත, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත, 1958 අංක 15 දරන අර්ථසාධක අරමුදල් පනත	අදාල පනත්වල විධිවිධානයන් ප්‍රකාරව ආයතනික ව්‍යවස්ථාපිත වගකීම් නිසි පරිදි නිරවුල් නොකිරීම හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට සේවක අර්ථසාධක අරමුදලට රු.327,882,739 ක්, සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට රු.26,441,310 ක්, එතු සේවකයින්ගේ අර්ථසාධක අරමුදලට රු.3,328,025 ක්, ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක අරමුදලට රු.4,017,078 ක්, ගෙවිය යුතු පාරිතෝෂික රු.418,598,740 ක් හා නඩු තීරණ මත ගෙවිය යුතු සේවක අර්ථසාධක හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර මුදල් රු.505,661,148 ක් ඇතුළත්ව ගෙවිය යුතු මුළු ව්‍යවස්ථාපිත වගකීම් වටිනාකම රු.1,259,487,731 ක් විය.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
(i) VIII පරිච්ඡේදය 4 වගන්තිය	අතිකාල දීමනා හිමි නැති මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් දෙදෙනෙකු සඳහා සති අන්තයේ හා රජයේ නිවාඩු දින රාජකාරී ඉටු කිරීම වෙනුවෙන් අතිකාල ලෙස රු.23,407 ක දීමනාවක් ගෙවා තිබුණි.

	(ii) XLVIII පරිච්ඡේදය 31 වගන්තිය	මණ්ඩලයේ වැඩ තහනමකට ලක් වූ රියදුරෙකු වෙනුවෙන් විනය පරීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර වැඩ තහනමට ලක්වීමෙන් පසු මාස 13 ක කාලයක් සඳහා රු.97,403 ක වැටුප් ගෙවා තිබුණි.
(ඌ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි සංග්‍රහය මූදල් රෙගුලාසි 175(1) "ආ"	ආයතනයනට ලැබිය යුතු මුළු මුදල, එකතු කළ මුළු මුදල හා නිගව පවතින මුළු මුදල නිවැරදිව පෙන්නුම් කළ හැකි ආකාරයට ලේඛන පවත්වාගෙන යා යුතු වුවත් මණ්ඩලයේ දේපළ බදු දීමෙන් ලද හෝ ලැබිය යුතු බදු මූදල් ප්‍රමාණය නිශ්චිතවම සඳහා ගැනීමට හැකි වන ලෙස ලේඛන පවත්වාගෙන නොතිබුණි.
(ඈ	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ ----------	
	(i) 2013 ජනවාරි 13 දිනැති අංක 1/2013 දරන චක්‍රලේඛය හා 2007 වර්ෂයේ නිකුත් කරන ලද උපදේශනයන් පත් කිරීම සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහය	චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව වයස අවුරුදු 60 සම්පූර්ණ වූ පසු අධිකාරිවරයකු විශ්‍රාම ගැන්වීම වෙනුවට විශ්‍රාම ගන්වනු ලැබූ දින සිට මණ්ඩලයේ උපදේශකවරයකු වශයෙන් සේවය දිර්ඝ කර තිබුණු අතර මාස 07ක කාලයක් සඳහා රු.779,106 ක් දීමනා වශයෙන් ගෙවා තිබුණි.
	(ii) 2003 ජුනි 02 දිනැති අංක පිරිඩී/12 දරන චක්‍රලේඛයේ 9.9 ඡේදය	මාසයක් තුල අතිකාල දීමනා ලෙස ගෙවන ලද සියළුම ගෙවීම් පිළිබඳ තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තාකර ඒ සම්බන්ධයෙන් විස්තර ඇතුලත් ලේඛන පවත්වාගෙන යා යුතු වුවත් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීමක් හෝ අදාල ලේඛන පවත්වාගෙන යාමක් සිදුකර නොතිබුණි.

(ඉ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.3.2 වගන්තිය	මුදල් සැපයීමේ මූලාශ්‍රය නොතකා සෑම ප්‍රසම්පාදන කටයුත්තක් සඳහාම මෙම මාර්ගෝපදේශය අදාල කර ගත යුතු වුවත් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව සමාලෝචිත වර්ෂයේදී වාහන අළුත් වැඩියා හා කර්මාන්තශාලා අළුත්වැඩියා සඳහා රු.3,949,695 ක් ගෙවා තිබුණි.
(ඊ)	2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 9කදී ලබා ගත් රු. 264,935ක් වූ අත්තිකාරම් කාර්යය නිම වී දින 10ක් තුළ පියවා නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.443,532,303 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉහත් වර්ෂයේ ඌනතාවය රු.413,342,667 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.30,189,636 ක පිරිහීමක් නිරීක්ෂණය විය. වෙනත් ආදායම් රු.86,401,287 කින් වැඩි වුවද මෙහෙයුම් දල අලාභය රු.103,809,185 කින් වැඩිවීම් ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

වැදගත් කාරක ප්‍රාග්ධන හා ලාභදායීත්ව අනුපාත කිහිපයක් පහත දැක්වේ.

	2015	2014
ජංගම වත්කම් අනුපාතය	0.26:1	0.23:1
ක්ෂණික වත්කම් අනුපාතය	0.24:1	0.19:1
දළ ලාභ අනුපාතය	(73%)	(49%)

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ව්‍යවස්ථාපිත වගකීම් ඉටුවීම සඳහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදාන යොදා ගැනීම හේතුවෙන් මණ්ඩලයේ ද්‍රවශීලතා මට්ටමේ සුළු වර්ධනයක් පෙන්නුවද, පංගුව් වගකීම් තුල නිශ්චිතවම ව්‍යවස්ථාපිත බැඳීමක් පවතින රු. මිලියන 1,259 කට අධික වගකීම් පැවතුණි.

(ආ) මණ්ඩලය උපයන දළ ලාභය තව දුරටත් වර්ධනය වී තිබුණු අතර, එය 2014 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සියයට 32 කින් වර්ධනය වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයට අයත් බදු ඉඩම් අතුරින් ඉඩම් 21 ක බදු කාලය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන්ද, ඉඩම් 25 ක බදු කාලය 2016 දෙසැම්බර් 31 දිනෙන්ද අවසන් වී තිබුණි. මෙම ඉඩම් නැවත බදු දීමට හෝ බදු දේපල නැවත අත්පත් කර ගැනීම් සඳහා මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

(ආ) ලිඛිත ගිවිසුමකට එළඹීමකින් තොරව ජාතික කඩදාසි සංස්ථාවේ ඇඹිලිපිටිය කඩදාසි කම්හල වෙත 2013 වර්ෂයේ සිට මණ්ඩලයේ සේවකයන් 12 දෙනෙකු ආරක්ෂක සේවයේ යොදවා තිබූ අතර කඩදාසි සංස්ථාව විසින් අදාල සේවකයින්ට අතිකාල නොගෙවීම හේතුවෙන් මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී රු.877,616 ක අතිකාල දීමනා එම සේවකයින් වෙත ගෙවා තිබුණි. ජාතික කඩදාසි සංස්ථාව, රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව යටතේ පාලනය වූ බැවින් එම සංස්ථාව වෙත මණ්ඩලය විසින් ගෙවීමට ඇති මුදලින් ගෙවන ලද අතිකාල දීමනාව අඩුකර මූල්‍ය ප්‍රකාශන වල ගැලපීමක් සිදුකර තිබුණද ඒ සම්බන්ධයෙන් අදාල ආයතනය සමග එකඟතාවයකට පැමිණ නොතිබුණි.

(ඇ) රිවිගල වතුයාය සඳහා මණ්ඩලය විසින් 2010 වර්ෂයේ සිට ආරක්ෂක සේවා සපයා දී තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විට අනවසර පදිංචිකරුවන් 137 දෙනෙකු එහි පදිංචි වී තිබුණි. ඒ සම්බන්ධයෙන් කළමනාකරණය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) නිමි තේ කැසුරුම්කර අලෙවිකරනු ලබන මණ්ඩලයේ පාරිභෝගික දාශය සමග ගනුදෙනු කළ ගැනුම්කරුවන් 20 දෙනෙකු හා 25 දෙනෙකු පිළිවෙලින් 2014 සහ 2015 වර්ෂයන්හිදී මණ්ඩලයට අහිමි වී තිබුණි. එමගින් මණ්ඩලයට අහිමි වූ නිමි තේ අලෙවි ආදායම රු.4,504,758 ක් විය. මේ සඳහා තේවල ගුණත්වය පහත වැටීම, තරහකාරීත්වයට මුහුණුදීම සඳහා තේ අලෙවිය සඳහා ප්‍රවර්ධන ක්‍රියාමාර්ග අනුගමනය නොකිරීම, ණය කළමනාකරණයේ පැවති දුර්වලතා හේතු වී තිබුණි.

4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

සමාලෝචිත වර්ෂයේ ජුනි හා ජුලි මාස වලදී හත්තාන වතුයායේ තෙළන ලද තේ දළු අනෙකුත් මාසයන් හි අලෙවිකළ මිලට වඩා පිලිවෙලින් රු.12.50 ක් හා රු. 10 ක් අඩුවෙන් අලෙවි කිරීම හේතුවෙන් මණ්ඩලයට සිදු වූ අලාභය රු.619,160 ක් විය.

4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයට අයත් වතුයායන් 5ක් තුල පිහිටි තේ කර්මාන්තශාලා සමාලෝචිත වර්ෂය අවසන් වන විට ක්‍රිය තත්ත්වයේ පැවතුන අතර එම කර්මාන්තශාලාවන් තුල පොත් අගය රු.7,639,107 ක් වටිනා යන්ත්‍ර සූත්‍ර පැවතියද ඒවා භාවිතා කළ හැකි මට්ටමට පත්කර ගැනීමකින් තොරව දිරායෑමට ඉඩහැර තිබුණි.

(ආ) හෝප් වතුයායෙහි 2010 වර්ෂයේදී ආරම්භ කළ වතුර බෝතල් ව්‍යාපෘතිය වෙනුවෙන් මිලදී ගනු ලැබූ රු.1,394,815 ක් වටිනා යන්ත්‍ර හා උපකරණ එම වර්ෂයේ සිටම ක්ෂය ගැලපීමට කටයුතු කර නොතිබුණි. කෙසේ වුවද 2015 වර්ෂයේදී ව්‍යාපෘතියේ කටයුතු අතහැර දමා තිබීමෙන් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් උපකරණ නිෂ්කාර්යව පැවතුණි.

4.4 හඳුනාගන්නා ලද පාඩු

වීලියමුල්ල වතුයායට අයත් ඉඩමක් නැවත බදු දීමේදී නව තක්සේරු වාර්තාවට අනුව බදු අය නොකිරීම හේතුවෙන් 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මණ්ඩලයට අහිමි වී තිබූ බදු ආදායම රු.3,388,350 ක් වී තිබුණි.

4.5 මෙහෙයුම් ක්‍රියාකාරකම්

එනසාල් ඵලදාව හෙක්ටයාරයකට වියලි එනසාල් කිලෝ 60 ක් වුවත්, කන්දලියය වතුයායේ ඇති හෙක්ටයාර් 08 ක එනසාල් වගාවෙන් සමාලෝචිත වර්ෂයේදී ලබාගෙන තිබූ ඵලදාව කිලෝ 68 ක් පමණක් විය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේදී එම වගාවේ ආරක්ෂාව හා අස්වනු නෙලීම සඳහා රු. 1,497,330 ක් වැයකර තිබුණි.

4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) 2003 ජූනි 02 දිනැති අංක පිරිඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛයේ 9.3 වගන්තිය අනුව බඳවා ගැනීම් හා උසස්වීමේ පරිපාටියක් සකස් කල යුතු වුවත්, මණ්ඩලයට එවැනි විධිමත් බඳවාගැනීමේ හා උසස්වීම් පරිපාටියක් සකස් කර නොතිබියදී 2015 හා 2016 වර්ෂයන් තුළ ආරක්ෂක නිලධාරී තනතුර සඳහා සේවකයින් දෙදෙනෙකු වෙත උසස්වීම් ලබා දී තිබුණි.

(ආ) අනුමත කාර්ය මණ්ඩලය තුල නොමැති තනතුරක් වන අලෙවි උපදේශක තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත නිළධාරියකු බඳවාගෙන සමාලෝචිත වර්ෂයේදී මාස 6ක කාලයක් සඳහා රු. 555,000 ක ගෙවීමක් කර තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 03 දිනැති අංක පිරිඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත වාර්ෂික ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සංස්ථාව විසින් 2015 වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කර තිබුණේ 2016 දෙසැම්බර් 01 දින දිය.

6. පද්ධති හා පාලනයන්

විගණනයට නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට එරින් වර මොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

	පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ)	ගිණුම්කරණය	ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ගිණුම් පිළියෙල නොකිරීම.
(ආ)	බදු දේපල නඩත්තු කිරීම	දේපල බදු දීම හා බදු ආදායම් අයකර ගැනීමට හා බදු දේපළ ආරක්ෂාකර ගැනීමේ අඩුපාඩු පැවතීම.
(ඇ)	ගෙවීම් පාලනය	සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල්වල ගෙවීම් කටයුතු විධිමත් කිරීම.
(ඈ)	තේ වගා කටයුතු	නිෂ්පාදනය වැඩිකර ගැනීමට හා නිෂ්පාදන පිරිවැය අවම කර ගැනීමට අවධානය යොමු නොකිරීම.

එච්. එම්. ගාමිණි විජේසිංහ
විගණකාධිපති

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

වාර්ෂික වාර්තාව 2015

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

1. ආයතනික තොරතුරු

1.1 ආයතනික නෛතික ස්වභාවය

1972 අංක 11 දරණ කෘෂිකාර්මික සංස්ථා පනත යටතේ, අංක 199/1M හා 1976 පෙබරවාරි 06 දින දරණ ගැසට් නිවේදනය ප්‍රකාරව ජනතා වතු සංවර්ධන මණ්ඩලය පිහිටුවන ලදී. ප්‍රධාන කාර්යාලය නො: 55/75 වොක්ෂෝල් පටුමග, කොළඹ 02 හි පිහිටුවා ඇත. 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද මූල්‍ය වාර්තාවලට ප්‍රධාන කාර්යාලයේ සහ වතු යායන් 16ක්, එක රබර් වත්තක් සහ එක පොල් වත්තක කාර්යසාධනය ඇතුලත්කර ඇත.

1.2 අදාල ගිණුම් වර්ෂය තුල මූල්‍ය ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය.

අදාළ ගිණුම් වර්ෂය තුලදී ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ මූලික ක්‍රියාකාරකම් වල සැලකිය යුතු වෙනසක් නොවීය. මෙහි මූලික ක්‍රියාකාරකම වනුයේ කෘෂිකාර්මික කටයුතු, තේ හා රබර් නිෂ්පාදනය සහ ඒවායේ විකුණුම් පිළිබඳ ක්‍රියාවලියයි. ජනවසම තේ වෙන්දේසියේ තැරැව්කරුවන් හරහා තේ විකිණීමට අමතරව ජනතේ පාරිභෝගික අංශය මගින්ද තේ වෙළඳාම් කරනු ලබයි.

2 . සැකසීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිර්දේශ කර ඇති 1995 අංක 19 දරන ශ්‍රී ලංකා ගණකාධිකරණ හා විගණන ප්‍රමිති පනතට අනුකූලව ජනවසමේ ශේෂ පත්‍රය, ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සහ ගිණුම් පිළිබඳ සටහන්ද ඇතුලත්ය.

2.2 ගණනය කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත සකස් කර ඇත. යෝග්‍ය හා විශේෂිත ප්‍රතිපත්ති මත දැක්වෙන සටහන් මගින් පැහැදිලි කර ඇත. උද්ධමන සාධක සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල කිසිදු ගැලපීමක් සිදු කර නොමැති අතර මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් සකස් කර ඇත.

2.3 ඇස්තමේන්තු විනිශ්චයන් භාවිතය

මෙම ප්‍රකාශ සකස් කිරීමේදී විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීම කළමණාකාරීත්වය විසින් සිදු කරන අතර එමඟින් ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම හා වත්කම්, වගකීම්, ආදායම හා වියදම් පිළිබඳව වාර්තාගත අගයන් කෙරෙහි අවධානය යොමු කරයි. අයවැය වාර්තා සහ අදාළ උප ලේඛන, ඓතිහාසික වාර්තා, අත්දැකීම් හා වෙනත් කරුණු මත පදනම් වූවක් බැවින් එම තත්වය යටතේ සාධාරණ බව සඳහන් කල හැක. වත්කම් හා බැරකම් ඉදිරියට ගෙන ආ වටිනාකම් අනුව තීරනය කරන ලද බව සඳහන් ක්ල හැක.

2.4 මණ්ඩලයේ පැවැත්ම

මණ්ඩලය තව දුරටත් පවත්වාගෙන යාම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඇගයීමක් සිදු කර ඇති අතර මණ්ඩලය ඇවර කිරීමට හෝ එහි ව්‍යාපාරික කටයුතු අවසන් කිරීමට අපේක්ෂා නොකරයි. ඒ අනුව ජනවසම අබණ්ඩව පවත්වාගෙන යාමේ පදනම මත මූල්‍ය වාර්තා සකස් කර ඇත.

2.5 සංයන්දනාත්මක තොරතුරු

පසුගිය වසර වල යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුගත වන පරිදි මණ්ඩලය විසින් ගිණුම්කරන ප්‍රතිපත්ති නිරන්තරයෙන් අනුගමනය කරන ලද අතර අදාල සංඛ්‍යා හා විස්තර ප්‍රකාශ වන්මන් වර්ෂයේ වාර්තාවලට අදාල වන පරිදි සකස් කර ඇත.

2.6 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනට පසුව සිදුවූ සියළු වැදගත් සිද්ධින් සලකා බලා යෝග්‍ය පරිදි මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ ආවරණය කිරීම් සිදු කර ඇත.

3 වෙනත් තොරතුරු

3.1 ජනවසම - ගලබොඩ වත්ත

1999 වර්ෂයේ රුපියල් මිලියන 40ක මූල්‍ය පහසුකමක් ලබාගැනීම පිණිස ඉහත වත්ත පැන් ඒෂියා බැංකුවට උකස් කර ඇත. ශේෂය කොටස් වශයෙන් වරින්වර ගෙවා ඇත. ගෙවිය යුතු පොළිය බැංකුව සමඟ ඇතිවූ එකඟතාවය අනුව අඩු කර ඇත, මෙහි ප්‍රතිඵලයක් ලෙස 2015 දෙසැම්බර් 31 දිනට ගෙවියයුතු ශේෂය ලෙස රු.69,536,282.63ක් පෙන්නුම් කරයි.

3.3 අධ්‍යක්ෂ මණ්ඩලයේ වෙනස්වීම්.

2015 මූල්‍ය වර්ෂ කාලසීමාව තුල එනම් 2015 ජූනි මස සිට නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර ඇත.

4 ප්‍රශස්ත ගණකාධිකරණයේ ප්‍රතිපත්ති

පහත සඳහන් ගණකාධිකරණ ප්‍රතිපත්ති සියළු කාලපරිච්ඡේදයන් සඳහා ඇතුලත් විය යුතුය.

4.1 ණය ගැනීමේ පිරිවැය

අපේක්ෂිත භාවිතය හෝ අලෙවිය සඳහා සුදානම් කිරීමට යම් සැලකිය යුතු කාලයක් වැය වන මෙය අත්පත්කර ගැනීමක්, ඉදිකිරීමක් හෝ වත්කමක් වන්නාවූ නිෂ්පාදනයක් වෙනුවෙන් ඍජුව දරන ලද පිරිවැයක් ලෙස ගත්හැකි ණය ගැනීමේ පිරිවැය මත පමණක් හැර එම පිරිවැය දරන ලද කාලපරිච්ඡේදයේ සිදුවූ වියදමක් ලෙස එම ණය ගැනීමේ පිරිවැය හඳුනාගනු ලබන අතර, නිශ්චිත වත්කම් වල අගයක් වශයෙන් ප්‍රාග්ධනීතකරණය කරනු ලැබේ. එසේ ප්‍රාග්ධනීතකරණය කරනු නොලබන ණය ගැනීමේ පිරිවැය ඒවා දරන ලද කාලපරිච්ඡේදයට අදාල වියදමක් වශයෙන් සලකනු ලබන අතර අදායම් ප්‍රකාශය තුල හෙළිදරව් කරනු ලැබේ.

4.2 වත්කම් හා ඒවායේ තක්සේරු පදනම

ශේෂ පත්‍රයේ ජංගම වත්කම් වශයෙන් වර්ග කරනු ලබන වත්කම් වන්නේ මුදල් හා ජනවසමේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ හෝ ශේෂ පත්‍ර දිනෙන් වර්ෂයක් ඇතුලත හෝ යන දෙකෙන් වඩා කෙටි කාලයක් තුල මුදල් බවට පත්කර ගත හැකි වත්කම්ය. ජංගම නොවන වත්කම් වන්නේ ශේෂ පත්‍ර දිනෙන් වර්ෂයක කාලයක් ඉක්මවා රඳවා ගැනීමට ජනවසම අපේක්ෂා කරන වත්කම්ය. දීර්ඝ කාලීනව වත්කම් වල වටිනාකම ප්‍රත්‍යාගණනය කොට නොමැති හෙයින් වත්කම් වල වර්තමාන වටිනාකම් මූල්‍ය ප්‍රකාශන වල සඳහන් සංඛ්‍යාවන්ගෙන් වෙනස් වෙයි.

4.2.1 දේපළ පිරියත හා උපකරණ

දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණන හා ප්‍රමාණ අගය ඒවායේ පිරිවැයෙන් තක්සේරු අගයන් සමුච්ච ක්ෂය කිරීම් හා හානිවීම් අඩුකර වර්තා කරනු ලැබේ.දේපළ පිරියත හා උපකරණ පිරිවැය යනු එම වත්කම් වල අපේක්ෂිත භාවිතය පිණිස ඒවා සක්‍රීය තත්වයට පත් කිරීම වෙනුවෙන් දරන ලද කවර හෝ වියදම්ද සමඟ ඒවායේ මිලදී ගැනීම් හා ඉදිකිරීම් පිරිවැයයි.

4.2.2 ක්ෂය වෙන්කිරීම් / ක්‍රමක්ෂය

සරල මාර්ග ක්‍රමයක් වන ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන කරනු ලැබේ. එහිදී දේපළ පිරියත හා උපකරණවල ඇස්තමේන්තු ගත ප්‍රයෝජන ආර්ථික ජීව කාලය මුලුල්ලේ එම වත්කම් වල පිරිවැය හෝ තක්සේරු අගයන් ක්ෂය කර හරිනු ඇත. මේ සඳහා යොදාගැනීමට තීරණය කල පහත සඳහන් ප්‍රතිශත හා අනුපාත මත එම දේපලවල ප්‍රයෝජනවත් ජීවකාලය තුල ක්ෂය කිරීම සිදු කිරීම කරනු ලැබේ.

	වතු	ප්‍රධාන කාර්යාලය
ගොඩනැගිලි	5%	5%
යන්ත්‍රාගාර හා යන්ත්‍රසූත්‍ර (පැරණි)	33.33%	12.5%
යන්ත්‍රාගාර හා යන්ත්‍රසූත්‍ර(නව)	20%	20%
ලයිනී නිවාස හා වැසිකිළි	5%	-
මෝටර් රථ වාහන	25%	25%
ගෘහභාණ්ඩ සවිකිරීම් හා උපකරණ	12.5%	12.5%
පරිනත වැවිලි	5%	-
පාරවල් සහ පාලං	5%	-
ජලවිදුලි බලාගාර	5%	-
පරිඝණක හා මුද්‍රණ යන්ත්‍ර (අළුත්)	20%	20%
පරිඝණක හා මුද්‍රණ යන්ත්‍ර	12.5%	12.5%

4.2.3 ස්ථිර ඉඩම් සංවර්ධන පිරිවැය

නව ප්‍රවේශ මාර්ග ඉදි කිරීම හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ඉඩමේ ස්වභාවය හා හැඩය විශාල වශයෙන් වෙනස් කිරීම වෙනුවෙන් දරන ලද පිරිවැය මෙම ස්ථිර ඉඩම් සංවර්ධන පිරිවැය වශයෙන් දැක්විය හැකිය.

4.2.4 මටටක්කුලිය හේනමුල්ල පිහිටි ඉඩම් හා ගොඩනැගිලි වල පිරිවැය පොත් වලින් ඉවත් කිරීම

මටටක්කුලිය, හේනමුල්ල පිහිටි අක්කර 5,රූඩ් 0, පර්චස් 26ක ඉඩම 2013 මාර්තු මස 04 දින නාගරික සංවර්ධන අධිකාරියට පවරාගෙන ඇත.

මෙම ඉඩම 1983 වර්ෂයේදී ජනවසම විසින් මිලදී ගෙන තිබූ අතර 1986 වර්ෂයේ සිට ඉදිකිරීම් ආරම්භවූ හෙයින් 2013 වර්ෂය වන විට මුළු ඉදිකිරීම් හා ඉඩමේ වටිනාකමද ඇතුළුව රු.71,227,681/-ක් ලෙස මුළු වටිනාකම ගිණුම් පොත් වල සටහන් කර ඇත. කරුණු එසේ හෙයින් මෙම ඉඩමේ මුළු වටිනාකම දැනට ජනවසමට අයිති නොවන බැවින් ස්ථාවර වත්කම් ඉවත්කිරීමේ ගිණුමකට මාරු කලයුතුය. ඉහත සඳහන් වත්කම මාරු කිරීම සම්බන්ධව 2015 වර්ෂයේ පොත්පත් වල පෙන්වා නැත .එමෙන්ම ගිණුම් පිළියෙල කරන අවස්ථාව වන විට මෙම මාරු කිරීම සටහන් කර නැත.

4.2.5 ආයෝජන වත්කම් බදු ඉඩම් සහ ගොඩනැගිල

ආයෝජන වත්කම්වලින් ජනවසම 2015 වර්ෂය තුලදි ලැබූ රු.130,367,401.13ක ආදායමක් ගිණුම් ගතකර ඇත. කෙසේ වෙතත් සියළුම විශේෂිත වූ වත්කම් මේ වනතෙක් හඳුනාගෙන ශේෂ පත්‍රයේ ආයෝජන වත්කම් යටතේ ගිණුම් ගත කොට නැත . එයට හේතු වී ඇත්තේ ආයතනය මේ වන විට ස්ථාවර වත්කම් ලේඛණයක් හා ජංගම නොවන වත්කම් ලේඛණයක් නඩත්තු නොවීම නිසාය. පසුගි කාලසීමාව තුල ස්ථාවර වත්කම් ලේඛණයක් අවශ්‍ය දත්තයන් සමහ යාවත්කාලීන කර නැත .

4.2.6 සීමිත කාල පරාසයන් සඳහා ඉඩම් සංවර්ධන පිරිවැය.

පරිනත හා පරිනත නොවූ වැවිලි

ක්ෂේත්‍රයේ සංවර්ධනය හා වාණිජ්‍යමය අස්වනු නෙලා ගැනීම අතරතුර කාලය තුල වගා කිරීම , නැවත වගා කිරීම , හිස්තැන් වගා කිරීම හා භෝග විවිධාංගීකරණය වෙනුවෙන් දරන ලද ව්‍යදම් පරිණත නොවූ වැවිලි යටතේ වර්ගීකරණය කර ඇත.

	පරිනත කාලය	අස්වනු නෙලීම ආරම්භ කිරීම
තේ	1- 4 වසර දක්වා	5වන වර්ෂය
රබර්	1සිට 6 වසර දක්වා	7 වන වර්ෂය

4.2.7 හිස්තැන් වගා කිරීමේ පිරිවැය

අදාල වගා ක්ෂේත්‍රයේ පූර්ව ඇස්තමේන්තු ගත කාර්යය සාධන ප්‍රමිතිය ඉක්මවා එහි ආර්ථික ජීව කාලය වැඩිවීම කෙරෙහි හේතු වන හිස්තැන් වගා කිරීම සඳහා දරන ලද පිරිවැය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 32(වැට්ලි) අනුව ප්‍රාග්ධනීතකරණය කරනු ලබන අතර ප්‍රයෝජනවත් ජීව කාලය තුල පරිනත වැට්ලි වලට අදාල වන අනුපාතයක් මත ක්ෂය කිරීම් කරනු ලැබේ. හිස්තැන් පිරවීමේ පිරිවැය ප්‍රාග්ධනීත වී නැති අතර එය ලාභ අලාභ ගිණුමට වර්ෂය තුල ගලපා ඇත.

4.2.8 භාණ්ඩ ලේඛණය

නිෂ්පාදන තොගය හැරුනකොට සෙසු තොග ලේඛන අයිතමයන් යල්පැනගිය හා අඩුවෙන් වැය වන භාණ්ඩ සඳහා නිසි ප්‍රතිපාදන සැලසීමෙන් අනතුරුව වඩා අඩු පිරිවැය හා ඇස්තමේන්තු ගත ශුද්ධ උපලබ්දි වටිනාකම මත තක්සේරු කරනු ලැබේ.

ශේෂ පත්‍ර දින දක්වා නිෂ්පාදිත හා ඊට පසුව මූල්‍ය ප්‍රකාශන සකස් කරන කාලය දක්වා විකුණන ලද අයිතමය පසුව උපලබ්දි මිල මත තක්සේරු කෙරේ. ඉතිරි තොගය ඇස්තමේන්තු ගත විකුණුම් මිල මත තක්සේරු කෙරේ. ප්‍රසිද්ධ වෙන්දේසියට අදාලව දැරීමට සිදුවන සියළුම වියදම් සහිත ශුද්ධ ඇගයීමකින් එම මිල ගණන් සමන්විත වේ.

4.2.9 වෙළඳ හා සෙසු ලැබියයුතු මුදල්

වෙළඳ කටයුතු වෙනුවෙන් ලැබියයුතු මුදල් බොල් ණය හා අවිනිශ්චිත ණය සඳහා ප්‍රතිපාදන ඇතුළුව එසේ ලැබිය යුතුයයි ඇස්තමේන්තු ගත ප්‍රමාණ වලින් දක්වා ඇත.

4.2.10 මුදල් හා වෙනත් ද්‍රවශීල වත්කම්

මුදල් හා වෙනත් ද්‍රවශීල වත්කම් වශයෙන් හඳුන්වන්නේ අතඇති මුදල්, බැංකු ශේෂය ,ඉතුරුම් තැම්පතු හා කෙටිකාලීන අයි ද්‍රවශීල ආයෝජනයන්ය.

5 වගකීම් හා වෙන්කිරීම්

5.1 සේවක විශ්‍රාම ප්‍රතිලාභ

අ.සේවක ප්‍රතිලාභ සැලසුම්

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පිළිබඳ පනත හා 1978 අංක 34 දරන ඉන්දීය සම්බවයක් ඇති තැනැත්තන් නැවත සිය රට යැවීමේ පනත යටතේ නියමිත පරිදි විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් සුදුසුකම් සහිත සේවකයන් සඳහා ක්‍රියාත්මක කරනු ලැබේ. SLAS 16 ට අනුව (සංශෝධිත 2006 සිට) විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය නිර්ණය කිරීමේදී එම පාරිතෝෂික ප්‍රතිලාභය සඳහා පළමු වසරේ සිට සියළුම සේවකයන් වෙනුවෙන් ප්‍රමාණවත් වෙන් කිරීමක් මූල්‍ය වාර්තා මඟින් වෙන් කරන්නේ නැත. කෙසේ වෙතත් 1983 අංක 12 දරන පාරිතෝෂික පනත අනුව සේවකයා වර්ෂ 5ක එක දිගට සේවාවක් සම්පූර්ණ කල පසු පාරිතෝෂික දීමනාවක් ලැබීමට හිමිකම් ලබයි. එම වගකීම මූල්‍ය වාර්තා වලින් පෙන්නුම් කරනු ලැබේ.

ආ. විශ්‍රාමික සේවකයින් සඳහා ගෙවියයුතු පාරිතෝෂික දීමනා

ජනවසම විසින් මූල්‍ය අර්බුදයකට මුහුණ පා තිබූ බැවින් පසුගිය වර්ෂ 15ක පමණ කාලයක සිට සේවකයින් 3977ක් වෙනුවෙන් පාරිතෝෂික මුදල් ගෙවා නැත. කෙසේ වෙතත් වතු සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු පාරිතෝෂික දීමනා නියම ආකාරයෙන් ගණනය කර වතුයායන්හි ගිණුම් පොත්පත්වල 2015 දෙසැම්බර් 31 දිනට සටහන්කර නොතිබිණි. එමෙන්ම පසුගිය වර්ෂවල එම ශේෂයන් සැසඳීම් කර තිබුනේද නැත. ප්‍රමාද වී ගෙවන පාරිතෝෂික දීමනා වෙනුවෙන් 30%ක අධිභාරයක් වශයෙන් ගෙවූ රු. 6,717,216.94/- ක් 2015 වසරේ ගිණුම් වාර්තාවල දක්වා ඇත.

ජනවසමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම වෙනුවෙන් විශ්‍රාමික සේවකයින්ට රු.25,315,453.90ක මුදලක් උසාවිය මාර්ගයෙන් ගෙවා ඇත. නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට පෙර රු.86,374,322.23ක් සේවකයින්ට ගෙවා ඇත.

ඇ. පාරිතෝෂික දීමනා සඳහා වෙන්කිරීම්

2015 දෙසැම්බර් 31 දිනට සේවයේ යෙදී සිටි සේවකයන් සඳහා ගණනය වූ පාරිතෝෂික දීමනාවට එම වසරට අදාල වූ මූල්‍ය ප්‍රකාශයේ ඒ වෙනුවට සපයා තිබූ ප්‍රතිපාදනය ප්‍රමාණවත් නොවීය. ඒ අනුව සැලකිය යුතු ප්‍රමාණයක්වූ අඩු ප්‍රතිපාදිත මුදල 2015 වසරේ ආදායම් ප්‍රකාශයට ඇතුලත් කිරීමට සිදුවිය.

ඈ. නිශ්චිත දායකත්ව සැලසුම් සේවක අර්ථ සාධක අරමුදල් , වතු සේවක අර්ථ සාධක අරමුදල්, ලංකා වතු හාම්පුතුන්ගේ සංගමය සහ සේවක භාර කාර අරමුදල.

අදාල දායකත්ව අරමුදල් හා ප්‍රතිපත්ති මගින් ආවරණය වන සියළුම සේවකයින් නිශ්චිත සේවක අර්ථ සාධක අරමුදල් දායකත්වය සහ සේවක භාර අරමුදල් දායකත්වය ලැබීමට සුදුසුකම් ලබයි.

සේවකයින්ගේ දළ ඉපයීම් වලින් 12%ක ප්‍රතිශතයක් ආයතනය විසින් අර්ථ සාධක අරමුදල් වලට (EPF,හෝ ESPS හෝ CPPS) සහ 3% ප්‍රතිශතයක් සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට ගෙවනු ලැබේ. 2000 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා සමහර සඳහන් කාල වකවානු තුල EPF,ETF සහ ESPS, CPPS යටා නොමැත. එබැවින් කම්කරු කොමසාරිස් තුමා ජනවසම අධ්‍යක්ෂ මණ්ඩලයට නීතිමය පියවර ගෙන ඇත. අර්ථ සාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට රු. 175,542,800/-ක් 2015 මුදල් වර්ෂය සඳහා ගෙවා ඇත. කෙසේ වෙතත් මහා භාණ්ඩාගාරයේ EPF,ETF සහ පාරිතෝෂික හිඟ මුදල් ගෙවීම සඳහා රු350,000,000ක් ලැබී ඇත.

2015-12-31 දිනට ශේෂය

ගෙවිය යුතු EPF (2002 සහ2015 දක්වා)	රු.	326,770,171.06
ගෙවිය යුතු ETF (2002 සහ 2015 දක්වා)	රු.	26,401,108.52
ගෙවිය යුතු ESPS (2002 සහ 2015 දක්වා)	රු.	5,579,492.35
ගෙවිය යුතු CPPS (2001සහ 2015 දක්වා)	රු.	1,585,032.98

5.2 වෙළඳ හා ගෙවිය යුතු මුදල්

වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂයන් ඒවායේ පිරිවැය මත දක්වා ඇත.

5.3 ප්‍රදානයන්

ගෙවීගිය කාලසීමාවට අදාලව හානිපූර්ණ කලයුතු බවට ක්‍රමානුකූල පදනමක් යටතේ හඳුනාගත් ආදායම් ප්‍රකාශයේ ඇති ආධාර හා ප්‍රදානයන්ට සම්බන්ධවූ වැය ප්‍රමාණයන් එකී ප්‍රදානයන් හා සැසඳිය යුතුය.

හානිපූර්ණ තත්වයට අදාලව ආයතනික මූල්‍ය තත්වයේ දැනටමත් අන්තර්ගතව ඇති වියදම් හෝ අලාභයන් ශේෂ පත්‍රයේ සඳහන් ඉදිරියේදී ලැබීමට ඇති ප්‍රධානයන්ට අදාල නොවේ.අදාල කාලසීමාවන් සඳහා මහා භාණ්ඩාගාරයෙන් රු.618,500,000ක මුදලක් ලැබී ඇත.

5.3.1 හඳුනා ගත් ආදායම්

සේවා සැලසීම් හෝ භාණ්ඩ අලෙවිය මගින් ලැබෙන ආදායම් ,ආපසු ගෙවීම් හා දීමනා වෙළඳ වට්ටම් හා ප්‍රමාණ ප්‍රතිදාන අඩු කොට ශුද්ධ ලැබූ හෝ ලැබියයුතු ප්‍රතිඵලයේ සාධාරණ අගය මත ගණනය කරනු ලැබේ.

අ . ආදායමට අදාල බ්‍රෝකර් ගාස්තු , විකුණුම් පිරිවැය හා සෙසු බදු හා ගාස්තු අඩුකොට ශුද්ධ ඉන්වොයිස් අගය මත ආදායම වාර්තා කරනු ලැබේ.

ආ. දේපල යන්ත්‍රාගාර හා උපකරණ බැහැර කිරීම සම්බන්ධයෙන් වන ආදායම් ස්වභාවයේ ලාභ හෝ පාඩු ආදායම් ප්‍රකාශය තුල ගිණුම් ගත කොට ඇත.

ඇ. පොළි හා සෙසු ආදායම් උපචිත පදනම මත දක්වා ඇත.

ඈ . අයහාර වියදම් පියවීම සඳහා ලැබූ භාණ්ඩාගාර අරමුදල් ආදායම් ගිණුමට බැර කර ඇත.

6. ප්‍රශස්ත ගිණුම්කරණ වැරදි නිවැරදි කිරීම.

6.1. පොදු සංචිත ගිණුම් ශේෂය වෙනස් වීම.

2000 වර්ෂය තුලදී බදු දේපළක් සඳහා අත්තිකාරම් වශයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙන් ලද රු. 50,000,000/-ක් වැරදීමකින් පොදු සංචිත ගිණුමට බැර කර ඇත. පසුව 2013 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත නිවැරදි ගිණුම් සටහන් තබන ලදී. මෙම ගිණුම් සටහන නිවැරදි කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ස්කන්ධය රු. 50,000,000/-කින් අඩුවී ඇත. ඒ අතරම බදු අත්තිකාරම් ගිණුමේ වැඩිවීමක් දක්නට ලැබූ අතර, පසුව එයින් රු.15,000,000/-ක වටිනාකමකින් හිලව් කිරීමක් 2014 වසරේදී සිදු කරන ලදී.

6.2 විශ්‍රාමික සේවකයින්ට ගෙවියයුතු පාරිතෝෂික දීමනා

ජනතා වතු සංවර්ධන මණ්ඩලය මූල්‍ය දුෂ්කරතාවයන්ට පත්ව තිබූ හෙයින් පසුගිය වසර 10 සිට 15 දක්වා කාලය තුල සේවය අවසන් කල විශ්‍රාමික සේවකයින් සඳහා පාරිතෝෂික දීමනා ගෙවා නැත. මෙම සේවකයින් සඳහා 2015 දෙසැම්බර් 31 දිනට රු.418,147,522.53ක ශේෂයක් ගෙවීමට ඇත. කෙසේ වෙතත් 2015 වර්ෂය තුලදී විශ්‍රාමික සේවකයින්ට පාරිතෝෂික දීමනා වශයෙන් රු.111,689,776.13ක් ගෙවා ඇත. එමෙන්ම ජනවසමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම හේතුවෙන් 2005 වර්ෂය තුලදී රු.25,315,490.90ක් එම සේවකයින්ට ගෙවා ඇත.

6.3 සෙන්ට්‍රල් හිල් පුද්ගලික සමාගම

මොන්ටෙක්‍රිස්ටෝ බදු ගිවිසුම යටතේ සෙන්ට්‍රල් හිල් පුද්ගලික සමාගමෙන් රු.30,843,880ක බදු මුදලක් 2015 වර්ෂයේදී ගිණුම් ගත කොට ඇත.

වත්කම්	සටහන්	31.12.2015	31.12.2014
		රු.	රු.
ජංගම නොවන වත්කම්			
වැඩිදියුණු නොකල ඉඩම්, පැවරු පරිනත වැව්ළි හා වෙනත් වත්කම්	FA-01	2,630,524.94	2,630,524,9
දියුණු කළ ඉඩම්, මාර්ග හා පාලම්, ලයන් නිවාස හා වැසිකිළි, ගොඩනැගිලි, ගබඩා	FA-02	1,476,895,973.49	1,476,472,990.5
පරිනත නොවූ වැව්ළි	FA-03	251,449,475.89	229,051,159.6
පරිනත වැව්ළි	FA-04	355,915,701.84	364,170,184.5
යන්ත්‍ර සූත්‍ර කාර්යාල උපකරණ හා රථවාහන	FA-05	66,541,544.48	69,586,691.5
පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර	FA-06	3,548,008.88	3,734,853.8
ලී බඩු හා සවිකිරීම්	FA-07	1,214,632.93	1,254,352.5
ජල සම්පාදන යෝජනා ක්‍රම හා කුඩා ජල විදුලි යෝජනා ක්‍රම සහ අත්කම් නිවාස	FA-08	12,207,529.47	13,156,230.9
ආර්ෂිත වැට විදුලි ආලෝකය, ගිනිසිරියා වගාව	FA-09	220,593.94	221,793.9
උනු ගල් ඔය වත්තතේ ස්ථාවර වත්කම්, නොනිමි ප්‍රාග්ධන වැඩ	FA-10	35,968,388.10	37,326,067.2
බදු වත්කම්	A-5	32,168,954.60	-
		2,238,761,328.56	2,197,604,849.7
ජංගම වත්කම්			
භාණ්ඩ ලැයිස්තුව			
ලැබිය යුතු වෙළඳ හා වෙනත්	A1	63,411,589.84	84,756,694.28
මුදල් හා චෙක්පත්	A2	550,234,588.24	460,909,654.26
ගැලපීම	A3	4,423,511.91	377,321.62
බදු වත්කම්	A4	11,190,988.07	11,234,223.17
	A-5	-	56,505,824.04
		629,260,678.06	613,783,717.31
වගකීම්		2,868,022,006.62	2,811,388,567.02
ප්‍රාග්ධන හා සංචිත			
ප්‍රාග්ධන			
සමුච්චිත අලාභ		3,670,000,000.31	3,670,000,000.31
		(7,862,672,540.44)	(7,419,140,237.71)
		(4,192,672,540.13)	(3,749,140,237.40)
සංචිත			
ප්‍රාග්ධන සංචිත			
පොදු සංචිත/ රාජ්‍ය ප්‍රධාන	L1	2,782,868,702.37	2,806,439,119.89
	L2	1,162,270,594.33	493,770,594.33
		3,945,139,296.70	3,300,209,714.22
ජංගම නොවන වගකීම්			
පාරිතොෂික ප්‍රතිපාදන			
බැංකු ණය		610,704,923.31	595,281,760.88
		116,951,431.45	187,170,270.98
		727,656,354.76	782,452,031.86
ජංගම වගකීම්			
පාරිතොෂික දීමනා			
පොලි දරණ ණය ගැනීම	L4	418,598,739.68	497,985,453.83
ණය භිමිබදු	L5	233,042,797.33	230,559,912.96
කැරැවිකරු අත්තිකාරම්	L6	19,540,273.69	25,484,968.19
ගෙවිය යුතු වෙළඳ	L7	93,924,942.10	93,609,092,77
සේ.අ.අ./ව.සේ.අ.අ./ලං.හා.අ.ද.	L8	549,734,176.02	532,548,944.73
සේ.හා.අ.සහ වෙනත් ගෙවිය යුතු මුදල්	L9	840,888,990.87	829,716,011.71
කැන්පතු/ බදු දේපල අත්තිකාරම්	L10	26,441,309.78	26,836,692.87
බැංකු අයිරා	L11	119,083,732.39	154,456,177.17
	L12	86,643,933.43	86,669,804.11
මුළු ස්කන්ධය හා වත්කම්		2,387,898,895.29	2,477,867,058.34
		2,868,022,006.62	2,811,388,567.02

ප්‍රධාන ගණකාධිකාරි

මෙම මූල්‍ය ප්‍රකාශ සැකසීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධව ජනවසම අධ්‍යක්ෂක මණ්ඩලය වගකීම් දරණ අතර, ජනවසම අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් තබා ඇත.

සභාපති

අධ්‍යක්ෂ

පළාත් වතු සංවර්ධන මණ්ඩලය

2015.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වාර්තාව

	සටහන් අංක	2015 රු.	2014 රු.
ආදායම්	1	584,772,523.65	662,016,324.47
විකුණූ වියදම්	2	1,011,866,874 99	985,301,490.49
දළ මෙහෙයුම් ලාභය/(අලාභය)	3	(427,094,351.34)	(323,285,166.02)
වෙනත් ආදායම්	4	220,696,252.99	134,294,965.21
දළ ලාභය/(අලාභය)		(206,398,098.35)	(188,990,200.81)
වියදම්			
පරිපාලන වියදම්	5	26,178,859.47	24,585,997.69
කාර්ය මණ්ඩල වියදම්	6	94,617,948.41	75,773,046.76
විකුණුම් හා අලෙවි වියදම්	7	292,814.60	225,531.54
විකුවල වෙනත් වියදම්	8	76,362,553.60	83,331,779.71
		197,452,176.08	183,916,355.70
මූල්‍ය වියදම්ට පෙර ලාභය/(අලාභය)		(403,850,274.43)	(372,906,556.51)
මූල්‍ය වියදම්	9	39,682,028.30	40,436,110.78
බදු වලට පෙර ලාභය/(අලාභය)		(443,532,302.73)	(413,342,667.29)

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට මූල්‍ය ප්‍රවාහය

			රු.
කාරක ක්‍රියාකාරකම් සඳහා මූල්‍ය ප්‍රවාහය			0
වසරේ ශුද්ධ ලාභය/(අලාභය)			(443,532.00)
ගැලපුම් දීමනාව			
